අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/04/60/07/44/බඳවා ගැනීම 2018/2019(II)-01

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2023.05.

**<u>නිවේදනයයි</u>**

**<u>අංක 1885/31 හා 2014.10.22 දින දරන නව විදුහල්පති සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව 2018/2019 සීමිත තරඟ විභාගය සමත් අයදුම්කරුවන්ගෙන් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම - II අදියර (2023)</u>**

01. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සේවා ව්‍යවස්ථානුකූලව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වූ 2019.02.10 දින පැවති සීමිත තරඟ විභාගය සමත්ව 2019.07.29 සිට 2019.08.08 දක්වා පැවති සාමාන්‍ය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ සඳහා **<u>සහභාගි වූ නිලධාරීන්ගේ</u>** නාමලේඛනය ඇතුලත් උපලේඛනය අමාත්‍යාංශ වෙබ් අඩවියේ (www.moe.gov.lk) පළ කර ඇත.

02. තවද, එහි දැක්වෙන http://recruitment1552.moe.lk යන වෙබ් සබැඳියට පිවිස ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය සටහන් කර ඉන් අනතුරුව ඔබගේ වර්තමාන පෞද්ගලික හා රාජකාරි තොරතුරු 2023.05.30 දිනට පෙර එහි ඇතුලත් කළ යුතු බවද අවධාරණය කෙරේ. තවද මේ සමඟ පහත දක්වා ඇති කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සම්පූර්ණ කළ යුතු ආකෘති පත්‍රය (ඇමුණුම 01) බාගත කරගෙන ඔබට අයත් වර්තමාන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් සම්පූර්ණ කර සහතික කරවා ගෙන අධ්‍යාපන අමාත්‍යාංශයේ විදුහල්පති ශාඛාව වෙත 2023.05.30 දිනට පෙර අනිවාර්යයෙන්ම ලැබීමට සැලැස්විය යුතු බව කාරුණිකව දන්වමි.

03. එමෙන්ම මෙම ලේඛනයේ නම ඇතුළත් වීම ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියේ පත්වීමක් ලැබීමට නියමිත බවට තහවුරුවක් නොවන බව අවධාරණය කරමි.

එම්. එන්. රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk